කැළණිය විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යයන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි තෙවන වසර පරීක්ෂණය (බාහිර )-2013

2016 - ඔක්තෝම්බර්

**BCOM E 3025 - මෙහෙයුම් කළමනාකරණය**

ප්‍රශ්න සංඛ්‍යාව : 06

කාලය : පැය 03 යි

ඕනෑම ප්‍රශ්ණ පහකට (05) පිළිතුරු සපයන්න.

---

01. අ. මෙහෙයුම් යනු " වැඩි වටිනාකමක් දෙමින් අමුද්‍රව්‍ය, නිමිද්‍රව්‍ය බවට පරිවර්තනය කරන්නාවූ ශ්‍රිතයක් හෝ පද්ධතියක් වේ". මෙහෙයුම් පරිවර්තන ක්‍රියාවලියේ ලක්ෂණයන් හඳුනාගන්න.

(ලකුණු 06)

ආ. " සංවිධානයක මෙහෙයුම් ශ්‍රිතය තනිව ක්‍රියාත්මක නොවේ". සංවිධානයක මෙහෙයුම් ශ්‍රිතය හා අනෙකුත් ශ්‍රිතයන් අතර අන්තර් සම්බන්ධතාවය විස්තර කරන්න.

(ලකුණු 06)

ඇ. මෙහෙයුම් උපායමාර්ග මගින් ඉටුකර ගැනීමට අපේක්‍ෂා කරන තරඟකාරි ප්‍රමුඛත්වයන් ( Competitive Priorities) මොනවාදැයි උදාහරණ සමග විස්තර කරන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 20)

02. අ. ගුණත්වය යනු " අවශ්‍යතා තෘප්තිමත් කරන ලක්ෂණයන් හා ගුණාංගයන්ගේ එකතුවකි". භාණ්ඩයක ගුණත්ව පැතිකඩයක් උදාහරණ සහිතව විස්තර කරන්න.

(ලකුණු 06)

ආ. සංවිධානයක් භාවිතා කරන විවිධ ගුණත්ව පාලන ක්‍රමයක් විස්තර කරන්න.

(ලකුණු 06)

ඇ. පහත පද කෙටියෙන් විස්තර කරන්න.

- ගුණත්ව අනුකූලත්වය
- සමස්ථ ගුණත්ව කළමනාකරණ මූලධර්ම
- සිග්මා 6
- ජාත්‍යන්තර ප්‍රමිති සංවිධානය (ISO)

(ලකුණු 2X4=08)

(මුළු ලකුණු 20)

03. අ. ක්‍රියාවලි උපායමාර්ගයන්හි ඇතුලත් විය යුතු අංග හඳුනාගන්න.

(ලකුණු 06)

ආ. ක්‍රියාවලි සැලසුම්කරණය සඳහා යොදාගන්නා විවිධ ලියවිලි /ක්‍රමයන් විස්තර කරන්න.

(ලකුණු 06)

ඇ. සංවිධානයකට තෝරා ගත හැකි විවිධ ක්‍රියාවලින් වර්ග කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 20)

04. අ. භාණ්ඩයක් හෝ සේවාවක් සංවර්ධනය හෝ වෙනස් කිරීමට පෙර සංවිධානයක් විසින් අවධානයට ලක්කළ යුතු ප්‍රධාන සාධක හඳුනාගන්න.

(ලකුණු 06)

ආ. ශක්‍යතා අධ්‍යයනයක් යනු කුමක්දැයි කෙටියෙන් දක්වා එහි ප්‍රධාන අධ්‍යයනයන් හඳුනා ගන්න.

(ලකුණු 06)

ඇ. භාණ්ඩ සංවර්ධනයේදී නිර්මාණ කණ්ඩායම් හි භූමිකාව විස්තර කර එය සමගාමී නිර්මාණ ක්‍රියාවලියට ( concurrent designing process) දායක වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 20)

05. අ. සේවා නිර්මාණ ක්‍රියාවලිය, භාණ්ඩ නිර්මාණ ක්‍රියාවලියෙන් වෙනස් වන්නේ ඇයි ? පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ආ. මනා ලෙස නිර්මාණය කළ සේවා පද්ධතියක ලක්ෂණයන් කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 06)

ඇ. සේවා පැස හා සේවා විස්තරයේ අඩංගු අංග කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 20)

06. කෙටි සටහන් ලියන්න.

අ. සේවා - ක්‍රියාවලි න්‍යාසය

ආ. ක්‍රියාවලිය ප්‍රතිඉංජිනේරුකරණය

ඇ. Computer Aided Designing

ඉ. අදහස් උත්පාදන ප්‍රභවයන්

(ලකුණු 5x4=20)